2022.02.03 දින පළවූ අංක 2266 ගැසට් පත්‍රයේ III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,267 - 2022 පෙබරවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2022.02.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 294 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 307 |

*සැ. යු.*- (i) අධිභාර බද්ද පනත් කෙටුම්පත 2022 පෙබරවාරි මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) සත්ව සුබසාධන පනත් කෙටුම්පත 2022 පෙබරවාරි මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 මාර්තු මස 04 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 පෙබරවාරි 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## මාවතගම ප්‍රාදේශීය සභාව

### මංමාවතක් පිළිබඳ දැන්වීමයි

අංක 2242 හා 2021.08.20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ ප්‍රසිද්ධ කරන ලද 654 කහපත්වල ග්‍රාම නිලධාරී වසමේ කැබිලිතිගොඩ පන්සල් මාර්ගය ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් ලෙස පිළිගැනීමට කිසිම විරෝධතාවයක් නොමැති බැවින් ඉහතින් සඳහන් කර ඇති මංමාවත මාවතගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් ලෙස පවරා ගැනීමට ක්‍රියා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. කේ. අනුර කමල් පෙරේරා,
සභාපති,
ප්‍රාදේශීය සභාව, මාවතගම.

2022 පෙබරවාරි මස 01 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

02-139

---

## මහරගම නගර සභාව

### නගර සභා ආඥාපනත යටතේ (255 වන අධිකාරිය) 50 හා 52 වන වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරියේ 50 හා 52 වන වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටිරාජ් ලක්රුවන් පියරත්න,
සභාපති,
මහරගම නගර සභාව.

2022 ජනවාරි මස 28 වැනි දින,
මහරගම නගර සභාවේ දී ය.

### උපලේඛනය

| *අනු. අංකය* | *සැලසුම් අංකය දිනය හා මිනින්දෝරු මහතාගේ නම* | *මාර්ගයේ නම* | *ග්‍රාම සේවා වසම* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* |
|---|---|---|---|---|---|---|---|
| 01. | සැලසුම්පත් අංකය : 2866 දිනය : 2018.10.22 පී. ඒ. එස්. ඩී. පෙරේරා | රුක්මලේ පාසල් මාවත වරිපනම් අංක 39/10 න් පටන් ගන්නා අතුරු මාර්ගය | රුක්මලේ | මීටර් 29.0 මීටර් 24.0 | මීටර් 4.50 මීටර් 3.8 | වරිපනම් අංකඃ 39/10 රුක්මලේ පාසල් මාවත | අංක : 31/7 |

| අනු. අංකය | සැලසුම් අංකය දිනය හා මිනින්දෝරු මහතාගේ නම | මාර්ගයේ නම | ග්‍රාම සේවා වසම | මාර්ගයේ දිග | මාර්ගයේ පළල | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය |
|---|---|---|---|---|---|---|---|
| 02. | සැලසුම්පත් අංකයඃ 1927 දිනය ඃ 2010.10.23 බී. යූ.එස්. ප්‍රනාන්දු මයා | රුක්මලේ මෛත්‍රී මාවත 2 වන පටු මග (වරිපනම් අංක 70 සිට 85 දක්වා) | 497 රුක්මලේ බටහිර | මීටර් 60.0 | මීටර් 4.57 | වරිපනම් අංක 70 | වරිපනම් අංක 85 |
| 03 | සැලසුම්පත් අංකයඃ 1333 දිනය ඃ 1979.06.08 එම්. ඩබ්. ඕ. පී. විජේසිංහ මහතා | තලපත්පිටිය පන්සල පාරේ වරිපනම් අංක 224 අසලින් හැරී වරිපනම් අංක 222/1 දක්වා ඇති අතුරු මාර්ගය | තලපත්පිටිය | අඩි 155.0 | අඩි. 14.0 15.0 | වරිපනම් අංක 224 | වරිපනම් අංක 222/1 |
| 04. | සැලසුම්පත් අංකයඃ 820 දිනය ඃ 1980.10.10 සිරි. ආර්. ලියනසූරිය මහතා | වැව පාර අංක 8 ස්ථානයෙන් ආරම්භවන අතුරු පාර | 532 C වත්තේගෙදර | මීටර් 90.3 මීටර් 23.0 | මීටර් 5.90 මීටර් 5.50 | වැව පාර අංක 8 | වරිපනම් අංක 10/5 B |
| 05. | සැලසුම් අංකයඃ 1871 දිනය ඃ 1987.02.17 එම්. සමරනායක මිනින්දෝරු මහතා | දෙපානම දේවාල පාර අතුරු මාර්ගය | 529A දෙපානම | මීටර් 77.25 | මීටර් 3.66 මීටර් 4.58 | වරිපනම් අංක 380 | වරිපනම් අංක 34/7 |

02-137

---

**කෑගල්ල ප්‍රාදේශීය සභාව**

1975 අංක 04 දරන වීථි නම් කිරීම සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීම සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීමට අදාල පනත සහ සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ 1999/1 (නීති) හා 1999 මාර්තු 28 දිනැති චක්‍රලේඛයට අනුව කටයුතු කර 2018.09.20 දින මහා සභා තීරණ අංක 18/09 ඉ-13 යටතේ ගන්නා ලද තීරණ ප්‍රකාරව 1174/21 අංක දරන 2001.03.09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ අංක 231 යටතේ ප්‍රකාශයට පත් කර ඇති කෑගල්ල ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි මාර්ගයක්වන මීදෙනිය පාසල ලඟින් වතුර ගමට යන අඩි පාර, සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති CLG/LG-5/5/2/2-9 හා 2021.11.12 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය අනුව මින් ඉදිරියට ''සමන් කුමාර කළුආරච්චි මාවත'' නමින් නම් කරන බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

02-147

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 01 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (05) (viii) යටතේ සභාව සම්මත කරන ලද පහත සඳහන් යෝජනාවට එකී පනතේ ඉහත කී උපවගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලෙස කටයුතු කරන එම්. ටී.එන්. කරුණාසේන වන මා විසින් අනුමැතිය දෙනු ලැබූ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ටී. එන්. කරුණාසේන,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

2019 දෙසැම්බර් මස 19 වැනි දින,
කුරුණෑගල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සිතියමෙන් සහ උපලේඛනයෙන් විස්තර කරන ප්‍රදේශය සඳහා උපරිම මට්ටමින් සේවාව ව්‍යාප්ත කිරීමට නිකවැරටිය ප්‍රාදේශීය සභාව කටයුතු කර ඇති හෙයින් දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් පිළිගත යුතු බවත්,

එම පිළිගැනීමේ යෝජනා සම්මුතියට කුරුණෑගල දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට ක්‍රියාකළ යුතු බවටත් නිකවැරටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

02-119

---

## මුලටියන ප්‍රාදේශීය සභාව

### දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලබාදී ඇති බලතල ප්‍රකාරව මුලටියන ප්‍රාදේශීය සභාව විසින් දෙයියන්දර නගරය ආශ්‍රිතව දියුණු ගම් බල ප්‍රදේශය ලෙස නම් කරමින් පහත උපලේඛනයේ සඳහන් යෝජනාව 2021 සැප්තැම්බර් මස 22 වැනි දින පවත්වන ලද මාසික සභාවේ දී ඉ 18 යෝජනාව යටතේ සභා සම්මත වූ බවත්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව මාතර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් දම්සර කරුණාජීව ලන්දගේ විසින් එකී සභා සම්මුතිය 2021.11.29 දින මාර/පපාසකෙ/08/02-7/2020 දරන ලිපිය මගින් අනුමත කර ඇති බවත්, මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුනිල් ඇල්ලදෙනිය,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මුලටියන.

2022 ජනවාරි මස 24 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවූ පහත උපලේඛනය හා සිතියම් මගින් විස්තර කෙරෙන සීමාවන් ඇතුළත පිහිටියා වූ ප්‍රදේශය සඳහා උපරිම මට්ටමින් සේවාව ව්‍යාප්ත කිරීම මුලටියන ප්‍රාදේශීය සභාව කටයුතු කර ඇති හෙයින් දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් පිළිගත යුතු බවත්, එම පිළිගැනීමේ යෝජනා සම්මුතියට මාතර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කළ යුතු බවටත් මුලටියන ප්‍රාදේශීය සභාව යෝජනා කරමි.

### *උපලේඛනය*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) පිහිටියා වූ අංක 275 දෙයියන්දර ග්‍රාම නිලධාරි කොට්ඨාසය ද, අංක 272A නෙරලම්පිටිය, අංක 275C ගල්ඇටුඹ අංක 275D මඩුවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයන් හි කොටස්වලින් සැදුම් ලත්

*උතුරට* : ඔව්ලාන ඇළෙහි මධ්‍ය රේඛාව හා හරත කුඹුර ඇලේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂයෙන් (අළුකැටිය ලැලි කඩේ අසලින්) ආරම්භ වී හරත කුඹුර ඇළෙහි මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර සහ උතුරු දිශානුගතව ඇදි රේඛාව කළුගලදෙනිය පොකුණේ නැගෙනහිර මායිමෙන් ගලන කළුගලදෙනිය ඇළෙහි මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට නැගෙනහිර දෙසට ලම්බකව අඳින ලද සෘජු රේඛාවක් ඔස්සේ එම ඇලෙහි වම් ඉවුර දක්වා ද, එතැන් සිට එම වම් ඉවුර ඔස්සේ උතුරු දෙසට ඇඳි රේඛාව කොහිලගහදෙනිය ඉඩමේ දකුණු මායිම දක්වා ද, එතැන් සිට එම ඉඩමේ දකුණු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ඇඳි රේඛාව දෙයියන්දර - හඳුගල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුර සහ ඊසාන දෙසට ඇඳි රේඛාව 3/2 දරන පිට ඇල බෝක්කුවෙහි මධ්‍ය ලක්ෂය දක්වාද, එතැන්සිට එම ඇලේ මධ්‍ය රේඛාව ඔස්ස් ගිණිකොන දිශානුගතව කිරම ආරේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද,


*නැගෙනහිරට* : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට කිරම ආරේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිනිකොන දකුණු දිශානුගතව ඇඳි රේඛාව පණ්ඩිත පෝරුව පාලමේ (මහඕකන්ද පාලම) මධ්‍ය ලක්ෂය දක්වා ද එතැන් සිට පණ්ඩිත පෝරුව මාර්ග යේ (දං හේන කිරිවැල්දෙනිය පාර) මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශානුගතව ඇඳි රේඛාව දෙයියන්දර කිරම මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, (ගොන්නගාව) එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත, දකුණු දිශානුගතව ඇඳි රේඛාව කි. මී. 1.9 ක් දුරින් පිහිටි ලක්ෂයක් දක්වා ද,

*දකුණට* : අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට නිරිත දිශානුගතව ඇඳි රේඛාව දෙනගම, මුලටියන මාර්ගයේ මධ්‍ය රේඛාව දක්වා ද, එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දෙසට ඇඳි රේඛාව 9/1 බෝක්කුවෙහි (කෝපිවත්ත බෝක්කුවෙහි) මධ්‍ය ලක්ෂය දක්වා ද, එතැන් සිට කෝපිවත්ත ඇලෙහි මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත දෙසට ඇඳි රේඛාව වැවලපියද්දේ සිට ගලන අතු ගංගාවේ මධ්‍ය රේඛාව දක්වා ද,එතැන් සිට එම අතු ගංගාවේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දෙසට ඇඳි රේඛාව කිරම ආරෙහි මධ්‍ය රේඛාව දක්වා ද, එතැන් සිට කිරම ආරෙහි මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ, බස්නාහිර, නිරිත, උතුර සහ බස්නාහිර දිශානුගතව ඇඳි රේඛාව සීනිපැල්ල පාලමේ මධ්‍ය ලක්ෂය දක්වා ද,

*බටහිරට* : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට කිරම ආරේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ දිශානුගතව ඇඳි රේඛාව ඕව්ලාන ඇලෙහි මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එම ඇලෙහි මධ්‍ය රේඛාව ඔස්සේ උතුර, ඊසාන හා වයඹ දිශානුගතව ඇඳි රේඛාව ආරම්භක ලක්ෂය හමුවන තෙක් ද වන මායිම්වලින් වට වූ සීමාව ඇතුළත පිහිටි වර්ග කිලෝමීටර 2.35 ක වර්ගඵලය සීමාව වේ.

# දෙයියන්දර නගරය ආශ්‍රිත දියුණු ගම් බල ප්‍රදේශය

## මුලටියන ප්‍රාදේශීය සභාව




වර්ගඵලය - ව.කි.2.35

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 12 දරන (අනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති CLG/LG-5/5/1/22 - 2 හා 2021/05/13 දිනැති ලිපිය අනුව පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සළකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහාද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පාර්ශවයක් වේ නම් මෙම දැන්වීම පළ කළ දින සිට මාස 03 ක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,<br>සභාපති,<br>කෑගල්ල ප්‍රාදේශීය සභාව.


| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | දෙවෙල්දෙනිය දික්ඇල්ල වත්ත අංක 679 මාර්ගය |
| ග්‍රාම නිලධාරි වසම | - | අංක 53 බී වල්දෙනිය වසම |
| මාර්ගයේ දිග | - | මීටර් 67.7 |
| මාර්ගයේ පළල | - | අඩි 12 |

| *මාර්ගයේ දකුණු පස* | *මාර්ගයේ වම්පස* |
|---|---|
| 1. පී. ජී. එස්. කිත්සිරි හිමිකම් පාන ලොට් අක 02 ඉඩම | 1. පී. ජී. එස්. කිත්සිරි හිමිකම් පාන ලොට් අංක 01 ඉඩම |
| 2. එච්. ආර්. එච්. උදයංගිකා හිමිකම් පාන ලොට් අංක 05 ඉඩම | 2. ඩී. පී. එස්. පද්ම කුමාරි හිමිකම් පාන ලොට් අංක 3 ඉඩම |
| 3. ඩී. පී. එන්. රුමේෂ් කුමාර හිමිකම් පාන ලොට් අංක 06 ඉඩම | 3. අයි. එස්. ජයසිංහ හිමිකම් පාන ලොට් අංක 3 ඉඩම |
| 4. ආර්. යූ. එස්. ජයවර්ධන හිමිකම් පාන ලොට් අංක 02 ඉඩම | 4. ඩී. ආර්. බන්දුල ජයරත්න හිමිකම් පාන ලොට් අංක 1 ඉඩම |

**P.G.R.A.DINANJAYA GAMLATH**
BSc(Surveying Sciences),
Registered Government Surveyor,
Registered Licensed surveyor & Leveller
Regd.No: 20081742
No.41,Rockhill, Kegalle.
Kegalle.
071-9890870, 075-9890870
e-mail-gamlathgl@gmail.com

## PLAN NO : 0117

Reference No.2020.06.KEG.0117
Field Book No.2020/03




Reference

| | |
|---|---|
| ST | Stake |
| U | Undefined |
| Road(PS) | Road(Pradeshiya Saba) |

**SCALE 1:1000**

**PLAN**

**OF**

An allotment of Land marked Lot 1 being resurvey of the amalgamated existing boundaries of defined Lot 8, depicted in Plan No.KGL/159, dated 25th December 2012, made by me, together with Lot 4 depicted in Plan No.2056, dated 18th January 2020, made by J.R.M.Bandara Jayakody, Lcd. Surveyor, of a land called DICKELLAWATTA, situated at Waldeniya village within Divisional Secretariat and Pradeshiya Saba Limit of Kegalle in Mawatha Pattu of Paranakuru Korale within

**KEGALLE DISTRICT**

**SABARAGAMUWA PROVINCE**

| Lot No | Extent | | | |
|---|---|---|---|---|
| | Ha: | A: | R: | P: |
| 1 | 0.0251 | 0 | 0 | 09.91 |
| Total | 0.0251 | 0 | 0 | 09.91 |

| Section | Length(m) | Width(Ft) |
|---|---|---|
| A - B | 67.70 | 12.0 |

1. Scale applies to original only.
2. Outer boundaries surveyed as pointed out by owner of the land.

Surveyed on
Date: 26th July 2020

Use for Local Authority

P. G. R. A. Dinanjaya Gamlath
Registered Licensed Surveyor & Leveller
L.S.C. Regd. No. 20081742
No.41, Rockhill, Kegalle
071 - 9890870, 075 - 9890870
e-mail-gamlathgl@yahoo.com

27th July 2020

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | මැටිවලහේන වත්ත මාර්ගය (උඩබද්දලව පාර) |
| ග්‍රාම නිලධාරි වසම | - | අංක 49 හෙට්ටිමුල්ල වසම |
| මාර්ගයේ දිග | - | අඩි 410 |
| මාර්ගයේ පළල | - | අඩි 10, 12 සහ 14 |


*මාර්ගයේ දකුණු පස*

1. ගයාන් වනිගසේකර හිමිකම් පාන ඉඩම
2. එස්. එම්. දමයන්ති හිමිකම් පාන ඉඩම
3. ආර්. එම්. ඩී. පී. කේ. රණතුංග හිමිකම් පාන ඉඩම
4. එච්. ආර්. නවරත්න මැණිකේ හිමිකම් පාන ඉඩම
5. අනුරුද්ධිකා හිමිකම් පාන ඉඩම
6. ආර්. චමින්දලාල් හිමිකම් පාන ඉඩම
7. පී. ඩී. රොසන් සංජීව හිමිකම් පාන ඉඩම

*මාර්ගයේ වම්පස*

1. ඩබ්ලිව්. ඩබ්ලිව්. රුවන් කපිල චමින්ද හිමිකම් පාන ඉඩම
2. එම්. ආර්. අජන්තා කුමාරි බාලසූරිය හිමිකම් පාන ඉඩම
3. මේදා ශ්‍රියානි සූරියප්පෙරුම හිමිකම් පාන ඉඩම
4. එච්. ඒ. කුමාරි මදුරප්පෙරුම හිමිකම් පාන ඉඩම

පී. ඉන්ද්‍රානි මල්ලිකා,
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු,
2 කණුව
හීයාවල
හන්දෙස්ස.




පරිමාණය 1 : 1000

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළයේ [illegible] පත්තුවේ [illegible] ග්‍රාමයේ පිහිටි ''මැණිවලේ [illegible] වත්ත'' නමැති ඉඩම සඳහා, ලයිසන් මිනින්දෝරු, ජී.පී.බී. [illegible] මහතා විසින් සාදන ලද අංක 2666/1 හා 2011.03.17 දින දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1 හි කොටසක මිනිසම [illegible] මාර්ග [illegible] දැක්වෙන

පිඹුර

[illegible] පරිදි වේ.

| කැබලි අංක | බිම් ප්‍රමාණය | | විස්තරය |
|---|---|---|---|
| | අ. රූ. ප. | හෙක්ටාර් | |
| 1 | 0. 0. 05.4 | 0.0136 | 10' |
| 2 | 0. 0. 07.0 | 0.0177 | 12' |
| 3 | 0. 0. 01.7 | 0.0043 | 10' |
| 4 | 0. 0. 05.0 | 0.0127 | 14' |
| එකතුව.............. | 0. 0. 19.1 | 0.0483 | |

දිග : 410' – 00''
පළල : 10', 12' සහ 14'

මනින ලද දිනය : 27. 10. 2018
බෙදන ලද දිනය :

P. INDRANI MALLIKA
Registered Licence Surveyor
2nd Mile Post,
Heeyawala, Handessa
T/P No 081 2059661
Reg No 1990095

27. 10. 2018
බලයලත් මිනින්දෝරු

සත්‍ය පිටපතකි

## යාපනය මහා නගර සභාව

### මාර්ගවල නාම ප්‍රසිද්ධ කිරීම

1989 වසරේ අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියැවෙන 252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 71(1) වැනි වගන්තිය ප්‍රකාරව, යාපනය දිස්ත්‍රික්කයේ යාපනය මහා නගර සභාවේ අංක JMC/2021/Gen/04/08, JMC/2021/Gen/05/02, හා 2021.04.28, 2021.05.20 දිනැති සාමාන්‍ය රැස්වීමේ තීරණයට අනුව යාපනය මහා නගර සභාවේ බල සීමාව ඇතුළත පිහිටා ඇති පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ග, මෙම මහා නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව යාපනය මහා නගර සභාව සතු කළ මාර්ග වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 71(1) වැනි වගන්තිය ප්‍රකාරව, දැනට යාපනය මහා නගර සභාව විසින් හඳුනාගනු ලැබූ මෙම මාර්ග සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශවයේ කවර හෝ තැනැත්තෙකු සිටී නම්, එම තැනැත්තා තම හිමිකම ඔප්පු කිරීමට හැකිවන ලියකියවිලි සමග අදාළ විරුද්ධත්වය, *ගැසට්* පත්‍රයේ මෙම නිවේදනය පළ කරන ලද දිනයේ සිට එක් මසක් ඇතුළත මා වෙත අයදුම් කිරීමට හැකිය. නැතහොත් තමන්ට තිබෙන අයිතිය සනාථ කිරීම සඳහා යාපනය මහා නගර සභාව වෙත කරන එක් මසක පූර්ව දැනුම්දීම සමග *ගැසට් පත්‍රයේ* මෙම නිවේදනය පළ කරන ලද දිනයේ සිට මාස තුනක කාලය ඇතුළත සුදුසු අධිකරණය වෙත නඩුවක් පැවරිය යුතු යැයි දැනුම් දෙනු ලැබේ.

විශ්වලිංගම් මනිවන්නන්,<br>නගරාධිපති,<br>යාපනය.

| *අංකය* | *සංකේත අංකය* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසන්වන ස්ථානය* | *වීදි රේඛාවේ දිග (අඩි)* | *මාර්ගයේ දිග (කි. මී.)* | *සාමාන්‍ය පළල - මීටර්* |
|---|---|---|---|---|---|---|---|
| 1 | 166 | පාසයියූර් කුඩ්ඉරුප්පු පාර | ශාන්ත අන්තෝනි පාර | අවසන් | 15 | 0.14 | 2 |
| 2 | 167 | සුවාමියාර් පටුමග | සුවාමියාර් පාර | මුහුදු වෙරළ පාර | 15 | 0.4 | 3 |
| 3 | 168 | මධ්‍යම නැගෙනහිර පාර 1 වන හරස් | නිවාස | අවසන් | 15 | 0.25 | 3 |
| 4 | 169 | මධ්‍යම නැගෙනහිර පාර 1 වන හරස් | නිවාස | අවසන් | 15 | 0.27 | 3 |
| 5 | 170 | මධ්‍යම නැගෙනහිර පාර 1 වන හරස් | නිවාස | අවසන් | 15 | 0.27 | 3.3 |
| 6 | 171 | සිප්පිත්තුරයි පටුමග | වතුර ටැංකි පාර | අවසන් | 15 | 0.2 | 3 |
| 7 | 172 | කාර්මික විද්‍යාලය පටුමග | මුහුදු වෙරළ පාර | කාර්මික විද්‍යාලය | 15 | 0.13 | 3.4 |
| 8 | 173 | කුණ්ඩි කනත්ත පාර | මුහුදු වෙරළ පාර | අවසන් | 15 | 0.1 | 2.7 |
| 9 | 174 | මහේන්තිපුරම් පටුමග | මුහුදු වෙරළ පාර | අවසන් | 15 | 0.2 | 2.4 |
| 10 | 175 | එළිලූර් පටුමග | මුහුදු වෙරළ පාර | අවසන් | 15 | 0.2 | 3 |
| 11 | 273 | නල්ලලක්සුමි ඇවනියු | කෝවිල පාර | අවසන් | 15 | 0.295 | 3 |
| 12 | 274 | මනියෝසයි පටුමග | කෝවිල පාර | අවසන් | 15 | 0.28 | 3 |
| 13 | 275 | රාජේශ්වරී අම්මන් පටුමග | කෝවිල පාර | අවසන් | 15 | 0.289 | 3 |
| 14 | 276 | කන්තන්කරුණයි පටුමග | කෝවිල පාර | අවසන් | 15 | 0.232 | 3.5 |

| අංකය | සංකේත අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසන්වන ස්ථානය | වීදි රේඛාවේ දිග (අඩි) | මාර්ගයේ දිග (කි. මී.) | සාමාන්‍ය පළල - මීටර් |
|---|---|---|---|---|---|---|---|
| 15 | 277 | පණ්ඩාරක්කුලම් 1 වන පටුමග | පණ්ඩාරක්කුලම් බටහිර පටුමග | අවසන් | 15 | 0.214 | 2.7 |
| 16 | 278 | සංගිලියන් 1 වන පටුමග | සංගිලියන් පාර | පණ්ඩාරක්කුලම් බටහිර පටුමග | 15 | 0.151 | 3 |
| 17 | 279 | පිරාමණකඩ්ඩු පටුමග | කෝවිල පාර | අවසන් | 15 | 0.362 | 3 |
| 18 | 280 | මුද්‍රණාලය පටුමග | මුද්‍රණාලය පාර | අවසන් | 15 | 0.17 | 2.4 |
| 19 | 281 | මැතිව්ස් පටුමග | මැතිව්ස් පාර | රාජසිංගම් පාර | 15 | 0.22 | 2.6 |
| 20 | 282 | නෙඩුංකුලම් පිල්ලයියාර් කෝවිල පාර | නෙඩුංකුලම් පාර | අවසන් | 15 | 0.78 | 3.2 |
| 21 | 283 | වසන්තපුරම් 1 වන හරස් | මුහුදු වෙරළ පාර | අවසන් | 20 | 0.23 | 2.5 |
| 22 | 284 | වසන්තපුරම් 2 වන හරස් | මුහුදු වෙරළ පාර | අවසන් | 20 | 0.15 | 2.4 |
| 23 | 285 | තේවරික්කුලම් පාර | කෝවිල පාර | කන්‍යාරාම පර | 15 | 0.32 | 2.4 |
| 24 | 286 | පණ්ඩාරක්කුලම් පිල්ලයියාර් පටුමග | සංගිලියන් පාර | අවසන් | 15 | 0.204 | 3 |
| 25 | 287 | මනීප්පුරි පාර | කොළුම්බුත්තුරයි පාර | දුම්රිය මාර්ගය | 15 | 0.9 | 3.8 |
| 26 | 288 | මනෝන්මනි අම්මන් පාර | කෝවිල පාර | අවසන් | 10 | 0.25 | 3 |
| 27 | 333 | වෙඩ්ඩුක්කුලම් පාර | පුවනේෂ්වරී අම්බාල් පාර | අවසන් | 20 | 0.18 | 2.7 |
| 28 | 424 | ඒ. පී. සී. පටුමග | පේදුරුතුඩුව පාර | අවසන් | 15 | 0.43 | 6 |
| 29 | 425 | සෙට්ටියාර් තෝට්ටම් පාර | ඒ. පී. සී. පටුමග | සෙම්මනි පාර | 15 | 0.8 | 3 |
| 30 | 426 | කුරුනාදර්සුවාමි පටුමග | පේදුරුතුඩුව පාර | අවසන් | 15 | 0.12 | 4 |
| 31 | 427 | සෙල්ලර් පටුමග | පේදුරුතුඩුව පාර | තිරුනෙල්වේලි අලුත් පාර | 15 | 0.169 | 2.5 |
| 32 | 428 | මහේෂ්වරි විද්‍යාලය පාර | රාමනාදන් පාර | අම්බාල් පාර | 20 | 0.16 | 3 |
| 33 | 511 | ආත්තිසූඩි පාර | සර් පොන් රාමනාදන් පාර | පලාලි පාර 5 වන පටුමග | 20 | 0.553 | 3 |
| 34 | 603 | පල්ලිය පටුමග | පොන්නාලයි පාර | ඕඩ්ඩුමඩම් පාර | 20 | 0.34 | 2.7 |
| 35 | 648 | වෛරවර් කෝවිල පටුමග | සිවප්ප්‍රකාසම් පාර | අවසන් | 15 | 0.17 | 2.7 |
| 36 | 651 | උඩයියාර් පටුමග | ඓයනාර් කෝවිල පාර | අවසන් | 15 | 0.06 | 4 |
| 37 | 652 | ඓයනාර් පටුමග | ඓයනාර් කෝවිල පාර | අවසන් | 15 | 0.1 | 2.8 |
| 38 | 653 | මදවඩි පටුමග | කංකසන්තුරයි පාර | සිවප්ප්‍රකාසම් පාර | 20 | 0.17 | 2.8 |
| 39 | 654 | නාච්චිමාර් පටුමග | කංකසන්තුරයි පාර | තලයියාලි පටුමග | 15 | 0.236 | 2.7 |

| අංකය | සංකේත අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසන්වන ස්ථානය | වීදි රේඛාවේ දිග (අඩි) | මාර්ගයේ දිග (කි. මී.) | සාමාන්‍ය පළල - මීටර් |
|---|---|---|---|---|---|---|---|
| 40 | 655 | තලයියාලි පාර | සර් පොන් රාමනාදන් පාර | සබාපදි පටුමග | 20 | 0.374 0.297 | 3 |
| 41 | 656 | තලයියාලි පටුමග | කංකසන්තුරයි පාර | තලයියාලි පාර | 15 | 0.298 | 2.7 |
| 42 | 657 | රාමනාදන් පටුමග | සර් පොන් රාමනාදන් පාර | තලයියාලි පාර | 15 | 0.213 | 3 |
| 43 | 658 | කලඩ්ඩි පිල්ලයියාර් පටුමග | සීනියර් පටුමග | සර් පොන් රාමනාදන් පාර | 20 | 0.194 | 3.1 |
| 44 | 659 | කලඩ්ඩි අම්මන් පටුමග | කලඩ්ඩි අම්මන් පාර | කලඩ්ඩි පිල්ලයියාර් පටුමග | 15 | 0.671 | 3.1 |
| 45 | 660 | වයල්කරයි පටුමග | වෛයනාර් කෝවිල පාර | මුරුගමූර්ත්ති පාර | 20 | 0.18 | 3 |
| 46 | 661 | හින්දු ප්‍රාථමික පාසල පටුමග | අරසඩි පාර | සිවගුරුනාදන් පාර | 20 | 0.295 | 3 |
| 47 | 662 | ඉලංකයිවේන්තන් පටුමග | විද්‍යාලය පාර | සිවගුරුනාදන් පාර | 20 | 0.14 | 3 |
| 48 | 663 | කණ්ණාතිඩ්ඩි 2 වන පටුමග | කණ්ණාතිඩ්ඩි පාර | අවසන් | 15 | 1 | 2.8 |
| 49 | 703 | කණ්ණකයි අම්මන් පාර | අරාලි පාර | පොන්නාලයි පාර | 20 | 0.18 | 2.7 |
| 50 | 716 | අරාලි පාර 1 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 10 | 0.15 | 2.8 |
| 51 | 718 | අරාලි පාර 3 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 10 | 0.15 | 2.6 |
| 52 | 719 | අරාලි පාර 4 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 10 | 0.15 | 2.4 |
| 53 | 720 | අරාලි පාර 5 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 10 | 0.15 | 2.5 |
| 54 | 721 | අරාලි පාර 6 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 10 | 0.15 | 2.8 |
| 55 | 722 | අරාලි පාර 7 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 10 | 0.15 | 2.6 |
| 56 | 723 | අරාලි පාර 8 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 10 | 0.17 | 2.3 |
| 57 | 724 | අරාලි පාර 9 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.19 | 2.2 |
| 58 | 725 | අරාලි පාර 10 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.05 | 3 |
| 59 | 726 | අරාලි පාර 11 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.09 | 2.1 |
| 60 | 727 | අරාලි පාර 12 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.1 | 2.1 |
| 61 | 728 | අරාලි පාර 13 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.1 | 2.1 |
| 62 | 729 | අරාලි පාර 14 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.04 | 2 |
| 63 | 730 | අරාලි පාර 15 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.08 | 3.2 |
| 64 | 731 | අරාලි පාර 16 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.1 | 2.5 |
| 65 | 732 | අරාලි පාර 17 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.04 | 2.8 |
| 66 | 733 | අරාලි පාර 18 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.02 | 4.5 |

| අංකය | සංකේත අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසන්වන ස්ථානය | වීදි රේඛාවේ දිග (අඩි) | මාර්ගයේ දිග (කි. මී.) | සාමාන්‍ය පළල - මීටර් |
|---|---|---|---|---|---|---|---|
| 67 | 734 | අරාලි පාර 19 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.02 | 4 |
| 68 | 735 | අරාලි පාර 20 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.06 | 3 |
| 69 | 736 | අරාලි පාර 21 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.3 | 4 |
| 70 | 737 | අරාලි පාර 22 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.2 | 2.5 |
| 71 | 738 | අරාලි පාර 23 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.3 | 2.4 |
| 72 | 739 | අරාලි පාර 24 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 15 | 0.3 | 2.4 |
| 73 | 740 | අරාලි පාර 25 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 10 | 0.1 | 2.4 |
| 74 | 741 | අරාලි පාර 26 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 20 | 0.14 | 2.3 |
| 75 | 742 | අරාලි පාර 27 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 20 | 0.3 | 2.5 |
| 76 | 743 | අරාලි පාර 28 වන හරස් පාර | අරාලි පාර | අවසන් | 20 | 0.17 | 2.6 |
| 77 | 824 | මණ්පිඩ්ඩි පටුමග | කාරෙයිනගර් පාර | අවසන් | 20 | 0.18 | 3 |
| 78 | 825 | කණ්ණාපුරම් 1 වන පටුමග | කණ්ණාපුරම් පටුමග | අවසන් | 20 | 0.84 | 3 |
| 79 | 826 | සෝල්පුරම් නිවාස සැළසුම් පටුමග | කාරෙයිනගර් පාර | අවසන් | 15 | 0.6 | 2.8 |
| 80 | 827 | පණ්ණයි ළය රෝග සායන රෝහල පටුමග | කාරෙයිනගර් පාර | අවසන් | 15 | 0.19 | 2.5 |
| 81 | 932 | කෝණාන්තෝට්ටම් පාර | පොන්නාලයි පාර | රෝහල පාර | 30 | 0.38 | 3.3 |
| 82 | 933 | ආරියකුලම් පටුමග | ස්ටැන්ලි පාර | අවසන් | 15 | 0.15 | 2.4 |
| 83 | 934 | රාසාවින්තෝට්ටම් වෛරවර් කෝවිල පාර | රාසාවින් තෝට්ටම් පාර | අවසන් | 15 | 0.14 | 2.4 |
| 84 | 935 | රක්කා නිවාස සැළසුම් පටුමග | රක්කා පාර | අවසන් | 15 | 0.19 | 2.5 |
| 85 | 1032 | ත්‍යාගි පටුමග | නාවලර් පාර | සෙට්ටිත්තෙරු පටුමග | 15 | 0.177 | 2.7 |
| 86 | 1035 | පාණාන්කුලම් පටුමග | කච්චේරිය නල්ලූර් පාර | නල්ලූර් හරස් වීදිය | 15 | 0.21 | 3 |
| 87 | 1036 | ආසිර්වාදප්පර් පටුමග | ආසිර්වාදප්පර් පාර | කලයිමහල් පාර | 20 | 0.14 | 2.1 |

# විවිධ දැන්වීම්

## හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

ආදාහනාගාරය ගාස්තු පැනවීම - 2022 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 නොවැම්බර් මස 25 වැනි දින පවත්වන ලද හඟුරන්කෙත ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව තීරණ අංක 04 යටතේ සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අයි. එම්. කේ. බී. ඉලංගන්තිලක,
සභාපති,
හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව.

2022 ජනවාරි මස 25 වැනි දින දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ සඳහන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව පහත සඳහන් සේවාවන් සඳහා පහත සඳහන් පරිදි ගාස්තු 2022 වර්ෂයේ දී පනවා අය කිරීමට හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*ආදාහනාගාරයේ වෙන් කිරීම.*

| | |
|---|---|
| බල ප්‍රදේශය තුළ | රු. 9,500 0 |
| බල ප්‍රදේශයෙන් පිටත | රු. 10,000 0 |
| පස්වරු 6.00න් පසු ආදාහන සඳහා (අමතරව) | රු. 500 0 |

02-118

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.